# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 61 — 1973 මැයි 25 වැනි සිකුරාදා — 1973.05.25

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 623 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 631 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| මුඩු බාහිරාදිය විකිණීම ... ... ... | 631 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| පොළුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 632 | විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—උද්භිද උද්‍යාන (සංශෝධන) පනත් කෙටුම් පත 1973 මැයි 11 දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 418, කොළඹ 2) පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ:—

| සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|
| 1. මෙරට සෑදූ වානේ සේප්පු සැපයීම... | 1973. 06. 14 |
| 2. සුදු කපු ඇඳ රෙදි (බෙඩ් කවර) සැපයීම ... | 1973. 06. 14 |
| 3. මෙරට සාදන ලද හෝ මෙරට සවි කරන ලද බිත්ති ඔරලෝසු සැපයීම ... | 1973. 06. 14 |

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රුපියල් 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින පෙරවරු 11 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 මයි මස 25 දින,
කොළඹ දී ය.

5–608—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

### රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව

කොළඹ 2, යුනියන් පෙදෙසේ/විදේශීය හා දේශීය වෙළඳ අමාත්‍යාංශයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය : තැ. පෙ. 560, කොළඹ) ඉරි සහිත ගැල්වනයිස් කම්බි සැපයීම සඳහා 1973 ජූලි මස 20 වැනි සිකුරාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, ශ්‍රීමත් සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා ආනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 ජූලි 19 වැනි බ්‍රහස්පතින්දා පෙ. ව. 11 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර රජයේ සැපයීම් දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ලංකා ප්‍රමිතිවලට අනුකූලව නිෂ්පාදිත භාණ්ඩවලට වැඩි සැලකිල්ලක් දක්වනවා ඇත.

ඇස්. ඒ. පී. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973 මැයි මස 25 වැනි දින,
කොළඹ දී ය.

5–659—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය පිහිටි දෙමහල් ගොඩනැගිල්ලට සම්බන්ධිත දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අයත් දෙමහල් ගොඩනැගිල්ලට සම්බන්ධිත වර්ග අඩි 2,764 ප්‍රමාණයෙන් යුත් දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 1973 ජූනි මස 18 දින ප. ව. 2.30 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

රු. 50,000 ක් හෝ ඊට වැඩි ගොඩනැගිලි ඉදිකිරීමේ වැඩ සඳහා රජයේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් පමණක් කොළඹින් බැහැර ඕනෑම කච්චේරියක හෝ කොළඹ 7, හෝටන් පෙදෙසේ අංක 60 දරණ ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී වෙත රු. 250 ක මුදලක් තැන්පත් කොට මුදල් භාර ගැනීමේ කුවිතාන්සිය කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ අංක 42 දරණ ස්ථානයේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීමේ අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් 1973 ජූනි 18 දින දහවල් 12.00 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත හැකිය. ටෙන්ඩර් පත් තැපෑලෙන් ඉල්ලා සිටින අය විසින් ටෙන්ඩර් පත් භාරගනු ලබන අවසාන දිනට ප්‍රථම ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට ක්‍රියා කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ලිපිනයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමට අවසර දෙනු ලැබේ.

මේ පිළිබඳව වැඩි විස්තර කාර්යාල වේලාවන් තුළ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඉදිකිරීමේ අංශය වෙතින් ලබාගත හැක.

අයි. කේ. වීරවර්ධන,
නියෝජ්‍ය කොමසාරිස්
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
42, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 7.

5–663—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය

#### උඩවලවේ ව්‍යාපාරයට අවශ්‍ය මානක උපකරණ සැපයීම
#### ටෙන්ඩර් අංක ' ඇස් '

#### ටෙන්ඩර් අවසාන දිනය : 1973 ජූලි මස 25 දින

උඩවලවේ යෝජනා ක්‍රමයට අවශ්‍ය මානක උපකරණ සැපයීම සහ භාරදීම සඳහා ලංකාවේ, කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 415 දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජූලි මස 25 වෙනි බදාදා පෙ. ව. 10.00 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. මෙම සැපයීම් ලබා ගැනීම සඳහා මුදල් යොදවනු ලබන්නේ ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ අරමුදල් සම්පත්වල ණය මුදලින් බැවින්, ලබාගත යුතු යෝග්‍ය ස්ථානවල සැපයුම්කරුවන්ගෙන් සහ ඔවුන් වෙනුවෙන් පමණක් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

3. විශේෂ අරමුදල් සම්පත් වලින් සැපයීම් ලබාගන්නේ පහත සඳහන් යෝග්‍ය ස්ථාන වලිනි :—

ඕස්ට්‍රේලියාව, බෙල්ජියම, කැනඩාව, ඩෙන්මාර්කය, ජර්මන් සමූහාණ්ඩුව, ජපානය, නෙදර්ලන්තය, එක්සත් රාජ්‍යය සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් සංවර්ධනය වන සාමාජික රටවල් :— (ඇෆ්ගනිස්ථානය, හොංකොං, ඉන්දියාව, ඉන්දුනිසියාව, කේමර් සමූහාණ්ඩුව, දකුණු කොරියන් සමූහාණ්ඩුව, ලාඕස්, මැලේසියාව, නේපාලය, පකිස්ථානය, චීන සමූහාණ්ඩුව (තායිවානය), ෆීජී, පිලිප්පීනය, සිංගප්පූරුව, තායිලන්තය, ටොන්ගාව, බටහිර සමෝවාව, පපුවා සහ නිව්ගිනියා දේශ සීමාව, වියට්නාම, සමූහාණ්ඩුව (සයිගොන්)

4. සම්පූර්ණ විස්තර සහ ටෙන්ඩර් ලියකියවිලි කොළඹ 7, බෞද්ධාලෝක මාවතේ අංක 415 දරණ ස්ථානයේ පිහිටි ගංගා නිම්න සංවර්ධන මණ්ඩලයේ මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලයේ ලේකම්ගේ කාර්යාලයෙන් ලබාගත හැක.

5. ටෙන්ඩර් ලියකියවිලි පහත සඳහන් තානාපති කාර්යාලවලින්ද ලබාගත හැක.

(අ) ඕස්ට්‍රේලියාවේ ලංකා මහ කොමසාරිස්තුමා
(ආ) කැනඩාවේ ලංකා මහ කොමසාරිස්තුමා
(ඇ) ඩෙන්මාර්කයේ සිටින ලංකා කොන්සල් ජනරාල්තුමා
(ඈ) ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවේ සිටින අතිගරු ලංකා තානාපති තුමා. බෙල්ජියම සහ නෙදර්ලන්තය
(ඉ) ජපානයේ සිටින ලංකා මහ කොමසාරිස්තුමා
(ඊ) එක්සත් රාජධානියේ සිටින ලංකා මහ කොමසාරිස්තුමා
(උ) ඉන්දියාවේ සිටින ලංකා මහ කොමසාරිස්තුමා
(ඌ) ඉන්දියාවේ බොම්බායේ සිටින ගරු වෙළඳ කොමසාරිස්තුමා
(එ) ඉන්දුනිසියාවේ සිටින අතිගරු ලංකා තානාපතිතුමා
(ඒ) සියුල්හි කොරියන් සමූහාණ්ඩුවේ සිටින ආර්ථික සහයෝගතා පිළිබඳ අධ්‍යක්ෂතුමා
(ඔ) මලයාසියාවේ සිටින ලංකා මහා කොමසාරිස්තුමා
(ඕ) බටහිර පකිස්ථානයේ සිටින ලංකාවේ වෙළඳ කොමසාරිස්තුමා
(ක) ලංකා තානාපතිතුමා, මැනිලා, පිලිප්පයින්
(කා) ගරු වෙළඳ කොමසාරිස්තුමා, සිංගප්පූරුව
(කැ) සංවර්ධන අධ්‍යක්ෂ, ජාත්‍යන්තර සහයෝගයා සහ සංවර්ධන මණ්ඩලයේ මුදල් අංශය, ටයිපෙයි, චීන සමූහාණ්ඩුව
(කෑ) තායිලන්තයේ ලංකා නියෝජිත තානාපතිතුමා
(කි) විදේශ අමාත්‍යාංශය, සයිගොන්, වියට්නාමය
(කී) ලංකා තානාපතිතුමා, බුරුමය.

යෝග්‍ය ස්ථානවල ප්‍රධානීන් වෙනුවෙන් ටෙන්ඩර් පත් ඉදිරිපත් කරන මෙරට නියෝජිතයින් විසින් ටෙන්ඩර් ලියකියවිලි කට්ටලයක් වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රු. 50 ටෙන්ඩර් තැන්පත් මුදලක් ද, අවලංගු කරන ලද මින් එක් කට්ටලයක් වෙනුවෙන් රු. 5 ක ගාස්තුවක් ද, ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරීට මුදලින් ගෙවිය යුතුය.

සභාපති,
මධ්‍යම ටෙන්ඩර් මණ්ඩලය,
ගංගා නිම්න භූමි සංවර්ධන මණ්ඩලය.

තැ. පෙ. 524,
කොළඹ 7,
1973 මැයි මස 25 වෙනි දින.

5–626—73.05. 25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

### ආහාර දෙපාර්තමේන්තුව

#### ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි හා රෙදි උර

කොළඹ චාමස් ධාන්‍යාගාරයේ තිබෙන 1,26,539 ක් පමණ වූ ප්‍රයෝජනයට ගත නොහැකි ගෝනි මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් 1973 ජූනි 12 වෙනි අඟහරුවාදා සවස 2 දක්වා අංක 330, යූනියන් පෙදෙසේ ආහාර දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් භාරගනු ලැබේ.

රු. 500ක් තැන්පත් කිරීමෙන් පසුව මෙම කාර්යාලයේ ලබාගත හැකි ෆෝරම් වල ටෙන්ඩර් පිළියෙල කළ යුතුය. ටෙන්ඩර් පිළිබඳ විස්තර වාර්තාවක් මෙම කාර්යාලයෙන් ඉල්ලුම් කළ විට ලබාගත හැකිවේ.

ආර්. කාතමුත්තු,
ආහාර කොමසාරිස් වෙනුවට.

1973. 05. 12 දින,
කොළඹ, 330, යූනියන් පෙදෙසේ දීය.

5–589—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් හිස් බෝතල 3,275 ක් සහ තාර බැරල් 985 ක් මිළ දී ගෙන ඉවත් කිරිම සඳහා එවනු ලබන ටෙන්ඩර් පත්‍ර දුම්රිය මූලස්ථාන ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් (ලිපිනය දු. සා. කාර්යාලය, තැ. පෙ. 355, ඔල්කොට් මාවත, කොළඹ) 1973 ජූනි මස 27 වෙනි බදාදා පෙ. ව: 11 වන තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර, අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් කරුවන් විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ සතුටුදායක ලෙස ඉටු කිරීමට තමාගේ මුදල් තත්ත්වය ප්‍රමාණවත් බව ඔප්පු කිරීම සඳහා අදාලවන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

3. මරදාන දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ෆෝර්ම කොළවල ටෙන්ඩර් ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුය.

4. ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රුපියල් 250 ක් මරදාන දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාර්යාලයේ හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1973 ජූනි 23 වෙනි සෙනසුරාදා දහවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

5. 1973 ජූනි මස 27 වෙනි දින පෙරවරු 11.05 ට දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

6. වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරී කාර්යලයෙන් ලබා ගත හැකිය.

එම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරී වෙනුවට.

1973 මැයි මස 5 වෙනි දින,
කොළඹ දීය.

5–613—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

ඇත්කිලිගොඩ බලවේග පෝෂකම් වැඩපලේ අතිරේක වැඩ සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 06. 14 දින පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 15,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමැති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 50.00 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973. 06. 13 දින පෙ. ව. 12.00 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතුවේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්‍ෂ.

යොමුව : 3/1 (1/50)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 මැයි මස 14 වැනි දින.

5–609—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

වෙලෝනාගි ආපන ශාලා ගොඩනැගිල්ල අළුත් වැඩියා කිරීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973. 06. 14 දින පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 3,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමැති කොන්ත්‍රාත් කරුවන් විසින් රු. 25.00 ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973. 06. 13 දින පෙ. ව. 12.00 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්‍ෂ.

යොමුව : 3/1 (1/51)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 මැයි මස 14 වැනි දින.

5–610—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

පහත දැක්වෙන බඩු මොරටුවේ වෙලෝනා රෙදි ගබඩාවෙන් මිලට ගෙන රැගෙන යාම සඳහා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973. 06. 21 වනදා පෙරවරු 10.00 දක්වා ටෙන්ඩර් බාරගනු ලැබේ.

මඳක් පලුදුවුණු නිම් සරොම් 60,000 ක් පමණ (සරොම් 10,000 බැගින් ගොඩවල් 6 ක් හා සරොම් 6,000ක ගොඩක්.)

2. ආපසු ගතහැකි තැන්පත් මුදල් වශයෙන් එක ගොඩක් රු. 2,500 බැගින් 1973. 06. 20 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැන්පත් කර කොළඹ බ්‍රිස්ටල් වීදියේ, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත අධ්‍යක්‍ෂගෙන් ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි හා ආකෘති පත්‍ර ලබාගත හැකිය.

3. වැඩි විස්තර සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්‍ෂ.

යොමු : 3/1 (5/47)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 මැයි මස 14 වැනි දින.

5–611—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

ටෙන්ඩර් දැන්වීමයි

රෙදි සායම් සහ රසායනික ද්‍රව්‍ය සැපයීම සඳහා සීල් තැබූ ටෙන්ඩර් කැඳවනු ලැබේ.

එක් ෆෝර්මයකට රු. 5 බැගින් ගෙවීමෙන්, විස්තර හා ටෙන්ඩර් ෆෝර්ම වාණිජ කළමනාකරුගෙන් ලබා ගත හැක.

ටෙන්ඩර් බාර ගන්නා අවසාන දිනය—1973 ජූනි 29 දින පෙ.ව. 10ට.

වාණිජ කළමනාකරු.

ජාතික පේෂකර්ම සංස්ථාව,
56, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7.

5–622—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය — කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් සහ සේවා.**—වර්ෂ 1973 ජූනි 11 වැනිද සිට 1973 දෙසැම්බර් 31 වැනිද දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන්වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බදුල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධසේවා සංගම් වලට අයිති සමිතිවලට ද, තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු, මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වවුනියාව යන පළාත්වල පිහිටි ඕනෑම සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාර ගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි, ආකෘති පත්‍ර සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘතිපත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට පෙර තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට සතුටු සෞඛ්‍යසේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම කාර්යාලයකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් හෝ ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උප ලේඛනයෙහි 5 වන තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "සෞඛ්‍ය සේවා අධිකාරි, බදුල්ල" යන ලිපිනයට එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම්ට හෝ භාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන් හි පෙ.ව. 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ෆෝර්මයේ "බී" උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවහොත් ටෙන්ඩර් ෆෝර්මයෙහි "සී" උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගනන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම්, එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවනට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද, පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම් කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කරගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනයෙක මවිසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර් කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගනන් මෙහි පළමු වන ඡෙදයේ සඳහන් කාලසීමාව ඉකුත්වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැතිනම් මිස ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේ 3 වැනි තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩුබාහිරාදිය ගබඩාකර තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ හෝ ඉඩ කඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—(i) ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තුවන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන් ම ඒවා පිළිපැදිය යුතු ද වන්නේ ය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

(ii) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 3½ ක් බැගින් ඇතුළත් වන සේ බත් වේල් දෙකක් සැපයීමට ටෙන්ඩර්කරුවන් විසින් මිල ගණන් දක්විය යුතුය.

(iii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස් කර ඇති නිසා, ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අවශ්‍ය වනු ඇත.

(iv) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත්, ඒ සඳහා සළාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවක දී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර, සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරගනු ලැබේ.

(v) කූපන් භාර නුදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාරදුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබා ගන්නා සහල් දනට මෙන් නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරනු ලැබේ ; හා

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිළෙත් සළාක සහල් මිළෙත් වෙනස අඩුකරගනු ලැබේ.

දෙස්තර ඩී. බී. නියංගොඩ,
බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලය,
1973 මැයි 8 වැනි දින දී ය.

ඉහත සඳහන් උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට | | | | | නොගෙවන රෝගීන්ට | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් | රුපියල් | | මාළු | බිත්තර | මස් | කරවල | එළවළු | මාළු | බිත්තර | මස් | කරවල | එළවළු |
| 1. කොස්ලන්ද දිසා රෝහල... | 100... | 800... | 1973 ජූනි 8 වැනි ද පෙරවරු 10.00 ට | 500... | 500... | 500... | 500... | 1,500... | 2,700... | 2,700... | 2,700... | 2,700... | 8,100 |

5–604—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

වවුනියා දිස්ත්‍රික්කයේ පහත සඳහන් තැනීම් වැඩ සඳහා 1973.06.22 වෙනි දින ප. ව. 2.30 දක්වා කොළඹ, තැපැල් පෙට්ටි අංක 500, ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—

| වැඩෙහි ස්වභාවය | ලියාපදිංචි විය යුතු මුදල |
|---|---|
| | රු. |
| වවුනියා දිස්ත්‍රික්කයේ, කොන්ඩමඩු-වව්වාපලයි පාරේ පළමුවැනි සැතැපුම් 3ක පාර වැඩිදියුණු කිරීම | 25,000 |

2. ඉහත සඳහන් වැඩ ඉදිරියෙහි සඳහන් කර ඇති ප්‍රමාණයට හෝ ඊට වැඩි මුදලකට රජයේ වැඩ, වාරිමාර්ග හෝ අධ්‍යාපන යන දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි වී ඇති ග්‍රාම සංවර්ධන සමිති, කම්කරු සමිති හා වි. සේ. ස. සමිති හා ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්වද, 1973. 06. 14 වෙනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

3. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට කලින් ටෙන්ඩර්කරුවන් විසින් රු. 100 ක මුදලක් වවුනියා දිසාපති කාර්යාලයේ තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් වවුනියා දිසාපති වෙත ඉදිරිපත් කළ යුතුය. ග්‍රා. සං. ස., වි. සේ. ස. ස, ආදී අනුමත කැරුණු සමිති ටෙන්ඩර් පෝර්ම සඳහා තැන්පත් මුදල් තැබීමෙන් නිදහස් කොට ඇත.

4. වවුනියා දිසාපති වෙතින් ලබාගත යුතු පෝර්ම (පිටපත් දෙක කින්) සම්පූර්ණ කර ටෙන්ඩර් පෝර්ම ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. මෙම ටෙන්ඩර් කැඳවීම පිළිබඳ සෑම විස්තරයක්ම වවුනියා දිසාපතිගෙන් ලබා ගත හැක. ටෙන්ඩරය තැපෑලෙන් නොඑවන්නේ නම් එය කොළඹ, මහා ලේකම් කාර්යාලයේ තුන්වැනි මහලේ අංක 357 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ පෞද්ගලිකව තැන්පත් කළ යුතුයි.

5. 1973.06.22 වෙනි දින පස්වරු 2.30ට කොළඹ මහාලේකම් කාර්යාලයේ අංක 357 දරණ කාමරයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ.

6. ගිවිසුම් කඩ කළ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවේ සඳහන් අයගෙන් ටෙන්ඩර් පත් භාරගනු නොලැබේ. තෝරාගන්නා ලද කොන්ත්‍රාත්කරු විසින් වැඩ සඳහා ලාංකික කම්කරුවන් පමණක් යෙදවිය යුතුයි. එම කම්කරුවන් බඳවා ගත යුත්තේ වැඩය කෙරෙන ප්‍රදේශයේ වැසියන් අතුරෙනි.

එස්. සිවඥානම්,
වවුනියා දිස්ත්‍රික්කයේ දිසාපති වෙනුවට.

1973.05.07 වෙනි දින,
වවුනියා දිසාපති කාර්යාලයේදීය.

5–602—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව-මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරි කොට්ඨාශය

1973 මුදල් වර්ෂයේ දෙවන භාගය සඳහා (1973. 07. 01 දින සිට 1973. 12. 31 දක්වා) මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරි යටතේ පාලනයවන ව්‍යාපාරයන් සඳහා ගොඩනැගිලි තැනීමට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීමයි

මෙහි පහත සඳහන් දිස්ත්‍රික්කයන් තුල මෙහි පහතින් දක්වා ඇති ගොඩනැගිලි ද්‍රව්‍යයන් සැපයීම සඳහා මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරි විසින් 1973 ජූනි මස 19 දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ :—

2. (1) බදුල්ල දිස්ත්‍රික්කය—නාගදීප අංශය හා මහියංගන පොදු ගොඩනැගිලි අංශය.

(2) මාතලේ දිස්ත්‍රික්කය—මිනිපේ 3 හා 4 පියවර.

3. (අ) පිලිස්සූ ගඩොල් දහස් ගණනින්, දහසක් කීය බැගින්ද? (එකක ප්‍රමාණය 8 3/4″ × 4 1/2″ × 2 3/4″ බැගින් විය යුතුය. ගඩොල් පෝරනය ව්‍යාපාරය සිට සැතපුම් පහක් ඇතුලත විය යුතුය.)

(ආ) ඉරු දෙක බැගින් යුතු පොල් අතු දහස් ගණනින් සැපයීම සඳහා දහසක් කීය බැගින් ද? (එකක් දිගින් අඩි හතටත් පලලින් අඟල් 12 ටත් නොඅඩු ඒවා විය යුතුය.)

(ඇ) අළු හුණු බුසල් ගණනින් සැපයීම සඳහා බුසලක් කීය බැගින් ද? (බුසලක බර රාත්තල් 44 කට නොඅඩු විය යුතුය.)

(ඈ) තම්බාපු හුණු බුසල් ගණනින් සැපයීම සඳහා බුසලක් කීය බැගින් ද?

(ඉ) අඟල් ½ සිට අඟල් 2 දක්වා වූ ප්‍රමාණවල කැටගල් එක් එක් වර්ගය කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද?

(ඊ) කළුගල් 6″ × 4″ කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද?

(උ) කළුගල් 6″ × 9″ කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද?

(ඌ) ගංගා වැලි කියුබ් ගණනින් සැපයීම සඳහා කියුබ් එකක් කීය බැගින් ද?

4. ඉහත සඳහන් එක් එක් ද්‍රව්‍ය නිපදෙයන ස්ථානයෙහිදීම සැපයීම සඳහාද, ඉහත සඳහන් ව්‍යාපාරයන්හි පිහිටි වැඩපලවල් වෙත ගෙන ගොස් සැපයීම සඳහාද, වෙන වෙනම මිල ගණන් සඳහන් කළ යුතුය.

5. මහියංගන ඉඩම් සංවර්ධන කාර්යාලයේ හෝ ඕනෑම දිසාපති කාර්යාලයක එක් එක් ව්‍යාපාරය වෙනුවෙන් රුපියල් පණහක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කර ඒ බැව් දැක්වෙන කුවිතාන්සියක් මා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු 1973 ජූනි මස 18 දින දහවල් 12 දක්වා මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරි විසින් නියමිත ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම්පස උඩ කෙළවරේ "ගොඩනැගිලි තැනීමට අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර්" යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයේ වම්පස යට කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය සඳහන් කර එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර එවිය යුත්තේ ලේඛනගත තැපෑලෙනි. නැතහොත් මහියංගන ඉඩම් සංවර්ධන කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුය.

6. සාර්ථක ටෙන්ඩර්කරුට ටෙන්ඩර් පිළිගත් බව දන්වා දෙසතියක් ඇතුලත සිට එකී ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රජය සතුකොට ඔහුගේ නම කොන්දේසි කඩකළ කොන්ත්‍රාත්කරුවන්ගේ නම් ලැයිස්තුවේ අඩංගු කරනු ලැබේ.

7. මහියංගන ඉඩම් සංවර්ධන නිලධාරි තැනගේ කාර්යාලයේදී 1973 ජුනි මස 19 දින පස්වරු 2ට ටෙන්ඩර්පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට අවශ්‍ය යයි හැඟී යන්නේ නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවට මෙහි පැමිණ සිටිය හැක.

8. කිසිම හේතුවක් නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමට හෝ ඕනෑම ටෙන්ඩරයක් හෝ ඉන් කොටසක් භාර ගැනීමේ අයිතිය මහියංගන ඉඩම් සංවර්ධන නිරධාරි සතුය.

කේ. ඩී. දයානන්ද ජිනදාස,
ඉඩම් සංවර්ධන නිලධාරී, මහියංගනය.

1973 මැයි මස 08 දින,
මහියංගන ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

5–603—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානයේ හොරොව්පතාන කොටස

උතුරු මැද දිසාවේ හොරොව්පතාන විධායක ඉංජිනේරු කොට්ඨාශයේ මෙහි පහත සඳහන් කොන්ත්‍රාත් වැඩ සඳහා ටෙන්ඩර් පත් කැඳවීම උතුරු මැද දිසා වැඩ අධ්‍යක්ෂ මගින් 1973.06.12 වෙනි දින පෙ.ව. 10 දක්වා බාර ගනු ලැබේ.

ටෙන්ඩර් භාරගත් වහාම විවෘත කරනු ලැබේ.

| ටෙන්ඩර් අංකය | වැඩවිස්තරය | උවමනා ලියාපදිංචිය රු. | ශ. | ටෙන්ඩර් සඳහා අවශ්‍ය තැන්පත් මුදල් රු. | ශ. |
|---|---|---|---|---|---|
| (1) ... | කොහොඹගස්කඩවැව සංවර්ධනය කිරීම ... ... ... ... | 50,000 | 0 | ... 50 | 0 |
| (2) ... | මැදවච්චිය වැව ප්‍රතිසංස්කරණය කිරීම ... ... ... ... | 67,000 | 0 | ... 100 | 0 |
| (3) ... | කපුගොල්ලැව–වාගොල්ලාකඩ පාර සංවර්ධනය කිරීම ... ... ... | 35,000 | 0 | ... 50 | 0 |
| (4) ... | ඉහළ දිවුල්වැව–ආනාඔලොන්දව පාර සංවර්ධනය කිරීම ... ... ... | 65,000 | 0 | ... 100 | 0 |
| (5) ... | කඩදෙක වැව ප්‍රතිසංස්කරණය කිරීම ... ... ... ... | 50,000 | 0 | ... 50 | 0 |

2. ඉහත දක්වා ඇති මුදලකට හෝ ඊට වැඩි මුදලකට වාරිමාර්ග, මහාමාර්ග, විධායක සිවිල් ඉංජිනේරු සංවිධානයේ ලියාපදිංචි ඇති කොන්ත්‍රාත් කරුවන් හා ග්‍රාම සංවර්ධන සමිති, ගොවිකාරක සභා සමිතිවලට මේ සඳහා ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ හැක.

3. හොරොව්පතාන විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර් ඉල්ලුම් පත් මගින් ඉල්ලුම් කළ යුතුය. එම ඉල්ලුම් පත් 1973.05.29 දින පෙ. ව. 12 දක්වා කාර්යාල වේලාවන්හිදී ලබාගත හැකිය.

4. කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිවීම සනාථ කිරීමේ සහතිකය හා දනට දෙපාර්තමේන්තුවේ කරන ලද වැඩ පිළිබඳවත්, විධායක ඉංජිනේරු සෑහීමකට පත්වන ලෙස කරන ලද ප්‍රකාශණයකින් පසුව ඉල්ලුම් පත් නිකුත් කරනු ලැබේ.

ටෙන්ඩර් ඉල්ලුම් පත් නිකුත් කිරීමේදී ඒ ඒ වැඩය සඳහා වුවමනා තැන්පත් මුදල් වි.ඉ. හොරොව්පතාන, මිහින්තලේ වෙත තැන්පත් කර ඇති බව සනාථ කළ යුතුය.

5. මේ සඳහා අවශ්‍ය විස්තර රාජකාරි වේලාවන්හිදී හොරොව්පතාන විධායක ඉංජිනේරු කාර්යාලය (මිහින්තලේ) දී දැන ගත හැක.

ඇම්. මාර්කන්ඩෙයර්,
විධායක ඉංජිනේරු,
හොරොව්පතාන කොටස.

1973.05.11,
මිහින්තලේ දී.

5–588—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය-දකුණු දිසාව

ගාල්ලේ දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් සේවය සඳහා ටෙන්ඩර් පත්, 1973 ජුනි මස 20 වැනි දින පෙරවරු 10 දක්වා බාරගෙන, එම වේලාව ගතවූ වහාම එම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ :—

"දෙනියාය කොට්ඨාශයේ විධායක ඉංජිනේරු සඳහා, ගාල්ල-දෙනියාය-පැල්මඩුල්ල පාරේ 42 වැනි සැතපුම් කණුව අසල කාර්යාල ගොඩනැගිල්ලක් තැනීම."

2. රු. 40,000 ට වඩා වැය වන ගොඩනැගිලි කටයුතු සඳහා රජයේ කිසියම් දෙපාර්තමේන්තුවක හෝ රජයේ කිසියම් සංස්ථාවක හෝ මෙම සංවිධානයේ ලියාපදිංචි වී සිටින කොන්ත්‍රාත්කරුවනට, සමුපකාර සමිතිවලට හා ග්‍රාම සංවර්ධන සමිතිවලට මෙම වැඩය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අය එසේ ලියාපදිංචි වී ඇති බවට සනාථ කිරීමට සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. ඔවුන් දැනට කරන මෙම දෙපාර්තමේන්තුවේ වැඩ හා ඒවායේ වටිනාකම පිළිබඳ ප්‍රකාශයක් දෙනියායේ විධායක ඉංජිනේරු වෙත ඉදිරිපත් කළ යුතුයි.

3. 1973 ජුනි 14 වෙනි දින ප. ව. 2 දක්වා දෙනියාය විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත හැකි ටෙන්ඩර් ආකෘති පත්‍රවල පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලබන්නේ රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් විධායක ඉංජිනේරුට ගෙවූ විට හෝ රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම කාර්යාලයට හෝ ඕනෑම දිසාපති කාර්යාලයකට ගෙවා ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට පමණි.

4. ටෙන්ඩර් පත්‍ර දෙ පිටපතකින් යුක්තව, ගාල්ලේ දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා ලූ කවරයේ සිල් තබා තිබිය යුතු අතර, වැඩයේ විස්තරය එම කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කර තිබිය යුතුය.

5. මෙම වැඩ පිළිබඳ සැළසුම් හා අනිකුත් සියළු තොරතුරු දෙනියාය විධායක ඉංජිනේරු කාර්යාලයෙන් කාර්යාල වේලාවන් තුළදී ලබාගත හැක.

එ ස්. පත්මනාතන්,
දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ.

දකුණු දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
ගාල්ල.
73. 05. 09.

5–656—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සේවාව—කොළඹ කොට්ඨාශය

කොළඹ කොට්ඨාශයේ පහත සඳහන් වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත්, 1973.06.11 වන දින පෙරවරු 11 දක්වා කොනිස්ටන් පෙදෙසේ, කොළඹ 7, බටහිර දිසාවේ වැඩ අධ්‍යක්ෂතුමා විසින් භාරගනු ලැබේ. ටෙන්ඩර් විවෘත කිරීම එවේලේම සිදු කෙරේ.

**2. වැඩයේ නම.**—කැළණියේ උතුරු බැම්ම අළුත්වැඩියා කිරීම සඳහා එම උතුරු බැම්මේ 2 වෙනි සැතපුම දක්වා අනුමත කරන වර්ගයේ බොරළු කියුබ් 2,500ක් සැපයීම.

**ටෙන්ඩර් තැන්පත් මුදල : රු. 100.**

3. 1973. 06. 06 වැනිදා දක්වා කාර්යාලීය වේලාවන් තුළදී ටොරින්ටන් චතුරශ්‍රය, කොළඹ 7, කොළඹ කොට්ඨාශයේ විධායක ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත හැකි ටෙන්ඩර් ෆෝර්මවල ටෙන්ඩර් අයදුම් පත් සකස් කළ යුතුයි.

4. ටෙන්ඩර් ෆෝර්ම සඳහා අයදුම් කරන යෝජිත ටෙන්ඩර් කරුවන්, ඔවුන් විසින් වෙනත් දෙපාර්තමේන්තුවල මෙවැනි වැඩ කර ඇති නම් ඒ ගැන විස්තර හා ඔවුන්ගේ මුදලින් ඇති වටිනාකම දක්වා ප්‍රකාශනයක් සැපයිය යුතුයි. සේවාව සතුටුදායක ලෙස කර ගෙන යෑම සඳහා ඔවුන්ගේ හැකියාව හෝ මුදල් හා වෙනත් අවශ්‍ය දේ, ගැන අමතර විස්තර අවශ්‍ය වුවහොත් දන්වූ විගැම විටක සැපයීමට සූදානම්ව සිටිය යුතුයි.

5. ෆෝර්ම නිකුත් කිරීමට පෙර ඉහතින් සඳහන් කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල විධායක ඉංජිනේරු කාර්යාලයට භාර දී හෝ ඒ වෙනුවෙන් තැන්පත් මුදල් ගෙවා ඇති බවට කච්චේරියෙන් ලබාගත් කුවිතාන්සියක් හෝ 1973.06.06 වෙනි දිනට හෝ ඊට පෙර කාර්යාල වේලාවන් තුළදී ඉදිරිපත් කළ යුතුයි.

6. මෙම වැඩය ගැන සියළුම විස්තර, සැලසුම් ආදිය හා කාර්යාලීය ඉංජිනේරු කාර්යාලයෙන් ලබා ගත හැක.

සී. පීරිස්,
වැඩ අධ්‍යක්ෂ, බටහිර දිසාව.

බටහිර දිසා වැඩ අධ්‍යක්ෂ කාර්යාලය,
තැ. පෙ. 1514,
කොනිස්ටන් පෙදෙස, කොළඹ 7.

5–657—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

**5 ශ්‍රී 2063 දරණ පාවිච්චි කළ නොහැකි රෙනෝල්ඩ් මෝටර් රථය විකිණීම සඳහා ටෙන්ඩර් කැඳවීම**

කොළඹ 7, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ, පුරාවිද්‍යා කොමසාරිස් විසින් 5 ශ්‍රී 2063 දරන රෙනෝල්ඩ් රථය විකිණීම සඳහා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ලියකියවිලි හා අමතර විස්තර පහත අත්සන් කොට ඇති අයගෙන් 1973. 06. 02 වැනි දින දවල් 12 දක්වා ලබාගත හැකිය.

ටෙන්ඩර්පත් භාරගැනීම 73.06.09 දින දහවල් 12 ට අවසන් වේ. ටෙන්ඩර් තැන්පත් මුදල රු. 200 යි.

ටෙන්ඩර්පත් විවෘත කිරීම හා පරීක්ෂා කිරීම ටෙන්ඩර් මණ්ඩලයක් විසින් 1973. 06. 18 වෙනිදා පෙ. ව. 10 ට සිදු කරනු ලැබේ. (එදිනට සියලුම ටෙන්ඩර්කරුවන්ගේ පැමිණීම අපේක්ෂා කරමි).

රාජා ද සිල්වා,
පුරාවිද්‍යා කොමසාරිස්.

1973. 05. 14 වෙනි දින,
කොළඹ 7,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ දී ය.

5–661—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

### ශ්‍රී ලංකා නාවික හමුදාව

ශ්‍රී ලංකා නාවික හමුදාවේ පහත සඳහන් කාර්යය සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර්, ඒ ඉදිරියෙන් දක්වා ඇති දිනයන්හි පෙරවරු 10 වනතුරු, කොළඹ 1, තැ. පෙ. 593, ශ්‍රී ලංකා නාවික හමුදාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ :—

| කාර්යය | ටෙන්ඩර් භාරගනු ලබන අවසාන දිනය | අවශ්‍යය මූල්‍ය වත්කම |
|---|---|---|
| (අ) නාවික හමුද මූලස්ථානයේ ප්‍රධාන ගොඩනැගිල්ලේ පිටත සුදු හුනු ගෑම සහ තීන්ත ගෑම සහ කොළඹ 1, කොඩිගහ වීදියේ සීමා කාප්පයේ සුදු හුනු ගෑම සහ තීන්ත ගෑම | 1973.07.06 ... | රු. 50,000 |

2. කොළඹ 1, ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධාරියාගේ කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල, දෙපිටපතකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම මූලස්ථානයේ මුදල් හා සිවිල් පාලන අධ්‍යක්ෂ වෙත, සෑම කාර්යක් සඳහාම වෙන වෙනම රු. 100 බැගින් තැන්පත් කර ලබාගත් ලදුපත ඉදිරිපත් කිරීමෙන්, අංක 17 දරණ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධාරිගේ කාර්යාලයෙන් 1973 ජූනි මස 22 දින දහවල් 12 වනතුරු ටෙන්ඩර්පත් ලබාගත හැක. ටෙන්ඩර් ගාස්තු වශයෙන් ආපසු නොගෙවනු ලබන රු. 5 ක මුදලක් ගෙවිය යුතුය. චෙක්පත්, මුදල් ඇණවුම් හෝ තැපැල් ඇණවුම් භාරගනු නොලැබේ.

3. ඉහතින් සඳහන් කර ඇති මූල්‍ය වත්කම් ප්‍රමාණය සඳහා රජයේ කොන්ත්‍රාත්තු භාරගන්නා ලද බවට විධිමත් ලිඛිත සාධක ඉදිරිපත් කළ හැකි අයදුම්කරුවන් පමණක් ටෙන්ඩරය ඉල්ලීම සඳහා සුදුස්සෝ වෙත්.

4. ටෙන්ඩරය ලියාපදිංචි තැපෑලෙන් එවිය හැකිවන අතර, නොඑසේ නම් මූලස්ථානයේ අංක 14 දරණ කාමරයේ ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය හැකි වේ. කවරයේ වම් උඩ කෙළවරේ "කොළඹ 1, නාවික හමුදා මූලස්ථානයේ සුදු හුනු ගෑම" යනුවෙන් සඳහන් කරන්න. ඉහත පළමුවැනි ඡේදයේ සඳහන් පරිදි ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට ලැබෙන සේ මෙම ටෙන්ඩර්පත් එවිය යුතුය. මෙම දිනය හා වේලාව පසුවී ලැබෙන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

5. ටෙන්ඩරය විවෘත කිරීමෙන් පසු සති 8 ක කාලයක් සඳහා ටෙන්ඩර්කරුවන් විසින් තම ටෙන්ඩරය විවෘතව තැබිය යුතුය.

6. කුමන හෝ සියළුම ටෙන්ඩර් පත් ප්‍රශ්න කිරීමකින් තොරව නිශ්ප්‍රභා කිරීමේ අයිතියත්, ටෙන්ඩරයක කුමන හෝ කොටසක් භාරගැනීමේ අයිතියත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සතුවේ. මෙම ටෙන්ඩරය සමග ප්‍රසිද්ධ කර ඇති උපදෙස් සහ ටෙන්ඩර් ආකෘති පත්‍ර සමග නිකුත්කරනු ලබන ටෙන්ඩර් පිළිබඳ පොදු රෙගුලාසි තරයේ පිළිපැද නැති ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

7. කුමන හෝ සියළුම ටෙන්ඩර්කරුවකු ටෙන්ඩරයේ අවසාන දිනට පෙර, ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත නොදන්වා, ටෙන්ඩර් ඉදිරිපත්කිරීම ප්‍රතික්ෂේප කළහොත් හෝ අසමත් වුවහොත් එම ටෙන්ඩර් තැන්පතු මුදල රාජසන්තක කරනු ලැබේ.

8. පිළිගත් ටෙන්ඩර්කරු විසින් යථෝක්ත කොන්ත්‍රාත්තුවේ සඳහන් කාර්ය සඳහා ලාංකික කම්කරුවන් පමණක් සේවයේ යෙදවිය යුතු අතර හැකි සෑම අවස්ථාවකදීම එම කාර්ය කැරෙන ප්‍රදේශයෙන්ම සේවකයින් බඳවාගත යුතුය.

9. ඉහත සඳහන් දිනයේ දී හා වේලාවේදී ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුනගේ නියෝජිතයිනට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

10. මෙම මූලස්ථානයේ අංක 17 දරණ කාමරයේදී සැලසුම් පරීක්ෂා කළ හැක. භූමිය සහ සැලැස්ම පරීක්ෂාකර බැලීම සඳහා කොළඹ, නාවික හමුදා මූලස්ථානයේ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධාරී සමග විධිවිධාන සලසාගත හැක.

11. තවදුරටත් අවශ්‍ය විස්තර ලබාගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු නිලධාරිට අයැදුම් කළ යුතුය.

එච්. ජේ. එස්. බෝල්ඩිසිං,
ලුතිනන් කොමාන්ඩර් (ඉ)., ශ්‍රී. ලං. නා. හ.,
නාවික හමුදාධිපති වෙනුවට.

1973 මැයි මස 15 වන දින,
කොළඹ 1,
තැ. පෙ. 593,
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානයේ දී.

5–671—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

### අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ 8, සර්පන්ටයින් පාරේ පිහිටි මූළුතැන්ගෙට හා මැගසින් පාරේ පිහිටි බේකරියට 1973.07.01 සිට 1973.12.30 දක්වා කාලයට වියලි රබර් දර හෝ කැලෑ දර සපයා ගෙනවිත් භාරදීම සඳහා ටෙන්ඩර් පත්, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජූනි මස 18 වෙනි දින ප. ව. 2 දක්වා භාරගනු ලැබේ. අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 100 ක මුදලක් තැන්පත් කොට ලබා ගන්නා කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1973 ජූනි මස 18 වෙනි දින දහවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනු පිටපතක්ද සහිතව ඉදිරිපත් කළ යුතුය.

2. වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් ලබා ගැනීමට පිළිවන.

එන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1973.05.10 දින,
කොළඹ 1,
බ්‍රිස්ටල් වීදියේ,
බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

5–674—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම්

### ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—බටහිර දිසාව

| සැපයීමේ/සේවයේ විස්තර | ටෙන්ඩර් පත් පියවූ දිනය | ලැබූ ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය | පිළිගත් ටෙන්ඩර් මුදල රු. ශ. |
|---|---|---|---|---|
| කැළණිය රජමහා විහාරය අවට මතුපිට ජලය බැස්වීම පිණිස අනුමතකල බොරළු සැපයීම | 26.04.73 ... | දහයයි ... | එම්. ඩී. බර්නාඩ් සුගතදස මහතා, 38, දකුණු රවුම් පාර, කුරුණෑගල | 71,905 0 |

ඇන්. පී. ඒ. විජේසේකර,
බටහිර දිසා වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

තැ.පෙ. 1514,
කොළඹ 7,
73.05.12 දින දීය.

5-658—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

## බඩු බාහිරාදිය විකිණීම්

### වෙන්දේසියේ විකිණීමයි

කොළඹ මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරුගේ ශාඛාව

පහත සඳහන් භාණ්ඩ 1973. 05. 31 දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන අතර වෙන්දේසිය පෙරවරු 9 ට ආරම්භ වේ.

1973. 05. 29 දින පෙරවරු 9.30 සිට පස්වරු 1 දක්වා තැපැල් තක්සේරුකරුගේ කාර්යාලයේදී භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

2. රේගු අයකැමිගේ හෝ ඔහුගේ සහායකයින්ගෙන් කෙනෙකුගේ අනුමැතියට යටත්ව සහ මෙහි මින් මතු සපයා ඇති අවලංගු කිරීමේ අයිතියට යටත්ව, සාමාන්‍යයෙන් වැඩිම ඉල්ලුම්කරු ගැණුම්කරු වේ. ඉල්ලුම්කරුවන් දෙදෙනෙකු හෝ වැඩි දෙනෙකු අතර ඇති වන කිසියම් මත භේදයකදී වෙන්දේසිය පවත්වන නිලධාරියාගේ තීරණය අවසාන තීරණය වේ.

3. හේතු ඉදිරිපත් නොකර ඕනෑම පුද්ගලයෙකුගේ, හෝ පුද්ගලයින්ගේ හෝ ලන්සුවක් පිළිගැනීමට, ප්‍රතික්ෂේප කිරීමට, වෙන්දේසිය පවත්වන නිලධාරියාට සහ අයකැමිට පුළුවන.

4. ලන්සුවක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ භාණ්ඩ රේගු භූමියෙන් ඉවත් කර ගැනීමට පෙර ඕනෑම වේලාවකදී, වෙන්දේසියක් අවලංගු කිරීමේ තනි අයිතිය අයකැමි වෙත තබා ගනී.

5. වෙන්දේසිය අවසානයේ දී පිළිගන්නා ලද ලන්සුවේ වටිනාකම සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසු භාණ්ඩ භාරදීම කරනු ලැබේ.

6. මිළදී ගන්නා භාණ්ඩවල තත්ත්වය සහ ඒවායේ අඩංගු ප්‍රමාණ සම්බන්ධයෙන් ගැනුම්කරු තමාම සෑහීමට පත්විය යුතු අතර, එකී භාණ්ඩවල ගුණය, ප්‍රමාණය හෝ තත්ත්වය හෝ භාණ්ඩවල මාත්‍රකා නාමය පිළිබඳව අයකැමි සහතික නොකරයි. ඉදිරිපත් කර ඇති කොන්දේසි පිළිගෙන ඇත්නම් හැර කිසිම හේතුවක් නිසා ගැනුම් මිළ අඩුකිරීමකට ගැණුම්කරුට හිමි කමක් නොලැබේ.

7. භාණ්ඩ පිළිබඳ විස්තර වල ඕනෑම වැරැද්දක් හෝ අත්හැරීමක් විය හැකි අතර, එවැනි වැරදි හෝ අත්හැරීම් හෝ කිසිම විධියකින් අවහිරයක් හෝ වෙන්දේසියට බලපෑමක් නොවිය යුතු මෙන්ම, ඒ වෙනුවෙන් කිසිම වන්දි ගෙවීමක් අනුමත නොකරන අතර, ලන්සු ලියා පදිංචි කිරීමෙන් පසු අනාවරණය වන අඩුවීම් පිළිබඳව කිසිම මිල අඩුකිරීමක් නොකරනු අතර, සහ ලන්සු තැබීමට ප්‍රථම ගැණුම්කරුණක් පිළිබඳව මිලදී ගැනීමට බලාපොරොත්තු වන්නන් තම තමාම සෑහීමට පත් වී සිටි යයි බලාපොරොත්තු වනු ලැබේ.

8. කොළඹ 1, මහ තැපැල් කාර්යාලයේ තැපැල් තක්සේරුකරුගෙන් සවිස්තර ලැයිස්තු ලබා ගත හැකිය.

"ගිටාර්" සංගීත භාණ්ඩ සඳහා කම්බි අඩංගු පෙට්ටි 192 යි. එක පෙට්ටියක කම්බි 12 බැගින්.

"ටෙක්ස්ටා" ලකුණු යෙදීමේ පෑන් පෙට්ටි 40 යි. එක පෙට්ටියක පෑන් 12 බැගින්.

රෝල් 164 ඇළුමිනියම් "ස්ටැම්පින් පොයිල්"

වොල්ට් 1.05 යේ ට්‍රාන්සිස්ටර් බැටරි 7,530 ක් අඩංගු පෙට්ටි 14 යි.

වොල්ට් 9 යේ ට්‍රාන්සිස්ටර් බැටරි 375 ක් අඩංගු පෙට්ටි 2 යි. කොන්ඩා සුවඳ කරන භාජන.

කොන්ඩා 295 ක්.

ඇඳීමේ උපකරණ කට්ටල 2 ක් හා කවකටු යනාදි උපකරණ අඩංගු කට්ටල 13 ක්.

ආගමික පදක්කම් 5,000 ක්.

මාල ඇට වැල් 75 ක්.

පාවිච්චි කරන ලද විදේශ මුද්දර තොගයක් යනාදිය.

ඊ. දුරෙයිරත්නම්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

තැත/73/විකිණම් 1.
තැපැල් තක්සේරු අංශය,
මහ තැපැල් හල,
කොළඹ.

5–612—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

**ප්‍රසිද්ධ වෙන්දේසිය—සංචාරක මහෙස්ත්‍රාත් උසාවිය, වලස්මුල්ල**

පහත සඳහන් භාණ්ඩ 1973 ජූනි මස 22 වන දින ප. ව. 12.30 ට මෙම උසාවි භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණන ලබන බැව් මහජනයාට මෙයින් දැනුම් දෙමි. එම භාණ්ඩ එදින දවල් 12 තෙක් බැලීමට හැකිවේ. ගැනුම්කරුවන් විසින් මුදලින් ගෙවීම කළ යුතු අතර, ඒ දිනම භාණ්ඩ ඉවත් කර ගත යුතුය.

**වෙන්දේසියේ විකිණීමට ඇති බඩු**

1. විදුලි පන්දම්
2. කැති
3. ඉතා කුඩා රත්‍රන් කැබලි එකයි
4. සූට්කේස්
5. උදළු
6. ටබ්ලා එකයි
7. යකඩ කූරු
8. පිහි
9. මැන්ටල්
10. ඩිස්ප්‍රින් පෙති
11. අත් පොරව
12. මහ පිහිය
13. පින්තල අසවු, සරනේරු හා ඉස්කුරුප්පු ඇණ
14. කැඩී ගිය රේඩියෝවක් හා ඊට අදාළ කොටස්
15. කරාබු කුට්ටමයි
16. රන්තරන් චේන් එකයි
17. සබන් කැට එකයි
18. රැජින ලකුණ රට උළු
19. දොරක් සහ ලාච්චුවක්
20. සරම්, ෂර්ට්, පටි, හැට්ට, බ්‍රසියර්, චීත්ත, ලේන්සු ආදිය
21. ලී තොග දෙකක්.

මෙයට අමතර භාණ්ඩ සඳහා ලැයිස්තු මෙම කාර්යාලයේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කර ඇත.

පී. එන්. අබේවීර,
මහෙස්ත්‍රාත් තැන, වලස්මුල්ල.

1973 මැයි මස 03 වන දින,
වලස්මුල්ල,
සංචාරක මහෙස්ත්‍රාත් උසාවියේ දීය.

5–512—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

## පුත්තලම දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම

1973 ජූලි මස 1 වෙනි දින සිට 1974 ජූනි මස 30 වෙනි දින දක්වා කාලය සඳහා

1973 ජූලි මස 1 වැනි දින සිට 1974 ජූනි මස 30 වැනි දින දක්වා වූ කාලය තුළ පුත්තලම දිස්ත්‍රික්කයේ රා තැබෑරුම්වල රා සිල්ලරට විකිණීමේ අයිතිය පමණක් විකිණීම සඳහා අංක 31/3 හා 1972.10.31 දින දරණ ශ්‍රී ලංකා ජනරජ ගැසට් පත්‍රයේ පළකරන ලද කොන්දේසිවලට සහ සුරාබදු බලපත්‍රයන්ට අදල පොදු කොන්දේසි මාලාවට යටත්ව, මෙහි උපලේඛනයේ ප්‍රකාර ටෙන්ඩර් පත්‍ර මවිසින් මෙයින් කැඳවනු ලැබේ.

2. පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති වෙත ලැබෙන පරිදි ටෙන්ඩර් පත්‍ර '1973/74 වර්ෂය සඳහා පුත්තලම දිස්ත්‍රික්කයේ රා තැබෑරුම් රේන්ද මිලට ගැනීමේ ටෙන්ඩරය' යි සඳහන් කර පහත උපලේඛනයේ දක්වා ඇති දිනයේ තැබෑරුමේ නමට ඉදිරියෙන් පෙන්වා ඇති වේලාව තුළදී මෙම කාර්යාලයට භාරදිය යුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ඕනෑම දිසාපති කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍රිකාවක විය යුතුය. තවද, ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කරන අය විසින්ම පුරවා සම්පූර්ණ කළයුතුය. නියෝජිතයකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරන කිසිම ටෙන්ඩර් පත්‍රයක් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලබන්නේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලාංකිකයන් වූ පුරවැසියන්ගෙන් පමණි.

4. එක් එක් තැබෑරුමක් සඳහා වෙන් වෙන් වශයෙන් ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළයුතු අතර එක් තැබෑරුමක් සඳහා එක ටෙන්ඩර් පත්‍රිකාවකට වැඩි ගණනක් කිසිම අයෙකු විසින් ඉදිරිපත් නොකල යුතුය.

5. සෑම ටෙන්ඩර් පත්‍රිකාවක් සමගම, ලංකා බැංකුවේ පුත්තලම කච්චේරි ශාඛාවෙන් හෝ වෙනත් ලංකා බැංකු ශාඛාවකින් හෝ භාණ්ඩාගාර කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය. මුදල් පුත්තලම දිසාපතිගේ ටෙන්ඩර් තැන්පත් ගිණුමට බැර කළ යුතුය. එක් එක් තැබෑරුම සඳහා රු. 500 ක මුදලක් තැන්පත් කළ යුතුය.

6. සෑම ටෙන්ඩර් පත්‍රයක් සමගම, රා තැබෑරුම් විකිණීම් කොන්දේසි මාලාවේ 4(3) (1) දරණ වගන්තිය ප්‍රකාර වටිනාකම් සහතිකයක්ද ඉදිරිපත් කළ යුතුය.

7. ටෙන්ඩර් පත්‍රිකාවට අදල තැබෑරුමේ නම සහ අංකය ලියූම් කවරයක වම් කෙළවරේ පැහැදිලිව ලියා ටෙන්ඩර් පත්‍රිකාව බහා මුද්‍රා තබා නියමිත දින නියමිත වේලාවේදී කච්චේරියේ ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය. නැතහොත්, ටෙන්ඩර් වැසීමේ කාලය ඉකුත් වීමට කළින් ලැබෙන පරිදි පුත්තලම දිසාපති නමට ලියාපදිංචි කල තැපැලෙන් එවිය යුතුය.

8. කිසියම් කාරණයක් සඳහන් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය දිසාපති සතුය.

9. සාර්ථක වූ ටෙන්ඩර් පත්‍රිකාව ඉදිරිපත් කළ අය ඔහුට එම වරප්‍රසාදය හිමිවූ විගස විකිණීමේ කොන්දේසි වලට අත්සන් තබා දිසාපති විසින් නියම කරනු ලබන ඇප තැන්පත් මුදලක් ගෙවිය යුතුය.

10. සුරාබදු කොමසාරිස් විසින් 1973/74 වර්ෂය සඳහා නියම කරනු ලබන රා රේන්ද විකිණීමේ කොන්දේසි වලට අනුකූල විය යුතු බව ටෙන්ඩර් කරුවන් වෙත දන්වමි. වෙනත් විස්තර පුත්තලම දිසාපති කාර්යාලයෙන් ලබාගත හැකිය.

බ. සු. විජේවීර,
පුත්තලම දිසාපති.

1973 අප්‍රේල් මස 25 දින,
පුත්තලම දිසාපති කාර්යාලයේ දීය.

### උපලේඛනය

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ග්‍රාමය | තැබෑරුම විවෘත කරන— වසන වේලාවන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 1. | පුත්තලම පළාත් ආණ්ඩු සභාවට අයත් දරණ කොට්ඨාශය වේනකුඩිරිප්පුව | අංක 2 පුත්තලම ප. ආ. සභාවට ... | පෙ.ව .8.00—ප.ව. 7.00 | |
| 2. | පුත්තලම් පත්තුව ... ... | නාවක්කුඩු (දළුව) ... ... | පෙ.ව. 8.00—ප.ව. 7.00 | |
| 3. | එම ... ... | මදුරන්කුලිය ... ... | පෙ.ව. 8.00—ප.ව. 7.00 | |
| 4. | එම ... ... | මුක්කුතොඩුවාව ... ... | පෙ.ව. 8.00—ප.ව. 7.00 | 1973 මැයි 28 දින පෙරවරු 11 ට |
| 5. | එම ... ... | මුන්දලම ... ... | පෙ.ව. 8.00—ප.ව. 7.00 | |
| 6. | කල්පිටිය ... ... | ඒත්තාලෙයි ... ... | පෙ.ව. 8.00—ප.ව. 7.00 | |
| 7. | හලාවත පළාත් ආණ්ඩු සභාව ... | ඉච්චන්පිටිය හලාවත ප.ආ. සභාවට අයත් අංක 2 දරණ කොට්ඨාශය | පෙ.ව. 8.00—ප.ව. 9.00 | |
| 8. | හලාවත පළාත් ආණ්ඩු සභාව ... | හලාවත ප.ආ. සභාවට අයත් අංක 3 දරණ කොට්ඨාශය අලුත්වත්ත | පෙ.ව. 8.00—ප.ව. 9.00 | |

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | ග්‍රාමය | කැබෑරුම විවෘතකරන– වසන වේලාවන් | ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අන්තිම දිනය හා වේලාව |
|---|---|---|---|---|
| 9. | උතුරු පිටිගල් කෝරලේ ... | ... උඩප්පුව දකුණ ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 10. | එම ... | ... කරුකුපොනේ ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 11. | එම ... | ... ආරච්චිකට්ටුව ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 12. | එම ... | ... බත්තුළුඔය ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 13. | එම ... | ... පම්බල ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 14. | එම ... | ... ඔලිදළුව ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 15. | නාත්තන්ඩිය ... | ... ඔුදුකටුව ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 16. | එම ... | ... අඩප්පරගම ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 17. | එම ... | ... මට්ටාකොටුව ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 18. | එම ... | ... කොඩුවාව ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | 1973 මැයි 28 දින පෙරවරු 11 ට |
| 19. | වෙන්නප්පුව ... | ... නාඔරාවිල ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 20. | එම ... | ... නන්ජුන්ඩන්කරේ ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 21. | එම ... | ... වයික්කාල ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 22. | එම ... | ... බොරලැස්ස ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 23. | එම ... | ... දුම්මලදෙනිය ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 24. | එම ... | ... උල්හිටියාව ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 25. | එම ... | ... කටුනේරිය ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 26. | එම ... | ... ලුණුවිල ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 27. | එම ... | ... වෙන්නප්පුව ... | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |
| 28. | එම ... | ... නැගෙනහිර නයිනාමඩම | ... පෙ.ව. 8.00—ප.ව. 7.30 | |

5–662—73.05.25 දින අංක 61 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුයි. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහාලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

### 1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|---|
| මැයි | ... 73.05.04 සිකුරාද | ... | 73.04.25 බදාදා | දවල් 12.00 |
| | 73.05.11 සිකුරාද | ... | 73.05.02 බදාදා | දවල් 12.00 |
| | 73.05.18 සිකුරාද | ... | 73.05.09 බදාදා | දවල් 12.00 |
| | 73.05.25 සිකුරාද | ... | 73.05.15 අඟහරුවාද | දවල් 12.00 |
| ජූනි | 73.06.01 සිකුරාද | ... | 73.05.23 බදාදා | දවල් 12.00 |
| | 73.06.08 සිකුරාද | ... | 73.05.30 බදාදා | දවල් 12.00 |
| | 73.06.14 බ්‍රහස්පතින්ද | ... | 73.06.06 බදාදා | දවල් 12.00 |
| | 73.06.22 සිකුරාද | ... | 73.06.13 බදාදා | දවල් 12.00 |
| | 73.06.29 සිකුරාද | ... | 73.06.20 බදාදා | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. මිරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.